www.pastpapers.wiki

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examiatios Sri Lanka

64 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord.Level) Examination, December 2016

| | | |
|---|---|---|
| දෙවන බස - සිංහල | I, II | පැය තුනයි |
| இரண்டாம் மொழி - சிங்களம் | I, II | மூன்று மணித்தியாலம் |
| **Second Language - Sinhala,** | **I, II** | **Three hours** |

இரண்டாம் மொழி - சிங்களம் **I**

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

கவனிக்க :

(i) எல்லா வினாக்களுக்கும் விடை எழுதுக. புள்ளிகள் 40 ஆகும்.

(ii) 01 தொடக்கம் 40 வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும் (1), (2), (3), (4) என எண்ணிடப்பட்ட விடைகளில் சரியான அல்லது மிகப் பொருத்தமான விடையைத் தெரிவுசெய்க.

(iii) உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் இலக்கத்தை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (×) இடுக.

(iv) அவ்விடைத்தாளின் பிற்பக்கத்தில் தரப்பட்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்து, அவற்றைப் பின்பற்றுக.

**Note :**

(i) *Answer **all** questions.*

(ii) *In each of the questions from* **1** *to* **40**, *pick one of the alternative* (1), (2), (3), (4) *which you consider is **correct or most appropriate.***

(iii) ***Mark a cross** (X) **on the number corresponding to your choice in the answer sheet.***

(iv) *Further instructions are given on the back of the answer sheet Follow them carefully.*

- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පදය තෝරන්න.

01 தொடக்கம் 05 வரையுள்ள வினாக்களில் தடித்த எழுத்தில் தரப்பட்டுள்ள சொல்லுக்குப் / சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.

Select the most suitable word for the words printed in **thick bold letters** in questions no. **1** to **5**.

1. ඔයා ගෙදර යන්නේ **කවුරුත්තෙක්ක** ද?
(1) කවුරු එක්ක ද? (2) කවුරුත් එක්ක ද? (3) කවුරුත් තෙක්ක ද? (4) කවුරුත් දෙක්ක ද?

2. හෙට තරගෙදි හයියෙන් **දුවන්නෝනෑ**.
(1) දුවන් ඕනෑ (2) දුවන නෝනෑ (3) දුවන්න නෝනෑ (4) දුවන්න ඕනෑ

www.pastpapers.wiki

www.pastpapers.wiki

3. වැරදි වැඩ කළොත්තෙහෙම දඬුවම් ලැබේවි.
(1) කළොත් එහෙම (2) කළා එහෙම (3) කළොත් තෙහෙම (4) කළත් එහෙම

4. මම අද ගෙදර යන්නෑ.
(1) යන නෑ (2) යන්නෙ නෑ (3) යනවා නෑ (4) යන්න නෑ

5. මට බනින්නෙපා.
(1) බනින්න එපා (2) බනින් එපා (3) බනින්නෙ එපා (4) බනි නෙපා

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් නිවැරදි උච්චාරණය සහිත පදය තෝරන්න.
6 தொடக்கம் 10 வரையுள்ள வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் சரியான உச்சரிப்பைத் தரும் சொல்லைத் தெரிவு செய்க.
Select the word with **correct pronounciation** out of the words given in questions **6** to **10**.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 6. | (1) | උඩ වැත්ත | (2) | උඩ පෙත්ත | (3) | උඩ ඇත්ත | (4) | උඩ පැත්ත |
| 7. | (1) | චිත්‍රය | (2) | සිත්‍රය | (3) | සිත්රය | (4) | චිත්තරය |
| 8. | (1) | කට්සිය | (2) | කඩ්සිය | (3) | කට්ටිය | (4) | කඩ්ටිය |
| 9. | (1) | දඹතෙණිය | (2) | තඹතෙණිය | (3) | දඹදෙණිය | (4) | තඹදෙණිය |
| 10. | (1) | දහවල් කාලය | (2) | තහවල් කාලය | (3) | තකවල් කාලය | (4) | දකවල් කාලය |

- අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැළපෙන ප්‍රශ්නය තෝරන්න.
11 தொடக்கம் 14 வரையான ஒவ்வொரு கூற்றுக்கும் மிகப்பொருத்தமான வினாவினைத் தெரிவு செய்க.
Select the **most appropriate** interrogative question for the given sentence in questions no. **11** to **14**.

11. අන්න නරියෙක් දුවනවා.
(1) දුවන්නේ මොකක් ද? (2) දුවන්නේ මොකෙක් ද?
(3) දුවන්නේ කොහොම ද? (4) දුවන්නේ මොක ද?

12. ඔය පැන්සල මගේ
(1) මේ පැන්සල කාගෙ ද? (2) මේ පැන්සල කවුද?
(3) මේ පැන්සල කොහොම ද? (4) මේ පැන්සල මොකක් ද?

13. තාත්තා හෙට වැඩට යනවා.
(1) තාත්තා වැඩට යන්නේ කීයට ද? (2) තාත්තා වැඩට යන්නේ මොකට ද?
(3) තාත්තා වැඩට යන්නේ කවදා ද? (4) තාත්තා වැඩට යන්නේ ඇයි?

14. මගේ ගම වවුනියාව
(1) ඔයාගේ ගම කවුද? (2) ඔයාගේ ගම කොහොම ද?
(3) ඔයාගේ ගම මොක ද? (4) ඔයාගේ ගම කොහේ ද?

- අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදි ව අකුරු යෙදී ඇති පදය තෝරන්න.
15 தொடக்கம் 18 வரையான வினாக்களில் சரியான எழுத்துகளைக் கொண்ட சொற்களைத் தெரிவு செய்க.
Select the word with **correct spelling** in questions no. **15** to **17**.

15. (1) ප්‍රතමාදාර (2) ප්‍රථමාදාර (3) ප්‍රතමාධාර (4) ප්‍රථමාධාර

www.pastpapers.wiki

www.pastpapers.wiki

16. (1) මද්‍යස්තානය (2) මධ්‍යස්තානය (3) මධ්‍යස්ථානය (4) මද්‍යස්ථානය

17. (1) ශබ්ද විකාශනය (2) සබ්ද විකාසනය (3) ශබ්ධ විකාසනය (4) ශබ්ද විකාෂනය

- අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.
  18 தொடக்கம் 20 வரையான வினாக்களில் பொருத்தமற்ற சொல்லைத் தெரிவு செய்க.
  Select the **inappropriate** word in questions no. **18 to 20.**

18. (1) ව්‍යසනය (2) උවදුර (3) ආපදාව (4) මර්දනය

19. (1) වෛද්‍යවරයා (2) බෙහෙත් (3) බැංකුව (4) රෝගියා

20. (1) වැස්ස (2) මැස්ස (3) ගංවතුර (4) ජලය

- අංක 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට සමානාර්ථයක් දෙන පදය තෝරන්න.
  21 தொடக்கம் 23 வரையான வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு ஒத்தகருத்தைத் சொல்லைத் தெரிவு செய்க.
  Select the **synonym** for the initially given word in questions no. **21 to 23.**

21. උලෙළ : (1) තරගය (2) උත්සවය (3) මැස්ස (4) උකුළ

22. සතුට : (1) සොම්නස (2) දොම්නස (3) විකසිත (4) මුකුලිත

23. අවවාද : (1) වදන් (2) ඔවදන් (3) ආදරය (4) සෙනෙහස

- අංක 24 සිට 25 ප්‍රශ්න සඳහා මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්න.
  24 மற்றும் 25 ஆகிய வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு எதிர்கருத்தைத் தரும் சொல்லைத் தெரிவு செய்க.
  Select the **antonym** of the initially given word in questions no. **24 and 25.**

24. එඩිතර : (1) නිර්භීත (2) සිත්කලු (3) සුරුවිරු (4) බියසුලු

25. කඩිසර : (1) විසිතුරු (2) කම්මැලි (3) ඉක්මන් (4) අපිරිසිදු

- අංක 26 සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
  26 தொடக்கம் 28 வரையுள்ள ஒவ்வொரு வினாவிலும் தரப்பட்ட படங்களுக்கான மிகப் பொருத்தமான கூற்றைத் தெரிவு செய்க.
  Select the **most suitable statement** for the picture given in each questions no. **26 to 28.**

26. 

(1) බිඳෙනසුලු ය.
(2) විදුරු භාවිත නොකරන්න.
(3) විදුරු භාණ්ඩ ඇති ස්ථානයකි.
(4) මත්පැන් පානය නොකරන්න.

27. 

(1) නිතර ශබ්ද ඇසෙන ස්ථානයකි.
(2) නිශ්ශබ්ද වන්න.
(3) නළා ශබ්ද කිරීම තහනම්.
(4) නළා ශබ්ද කිරීමට අවසර ඇත.



www.pastpapers.wiki

www.pastpapers.wiki

28. 

(1) කසළ බඳුනට දමන්න.
(2) කසළ බඳුනට නොදමන්න.
(3) ප්ලාස්ටික් භාවිතය තහනම්.
(4) කුඩ භාවිත නොකරන්න.

- අංක 29 සිට 30 ප්‍රශ්නවලට ගැළපෙන උත්තරය තෝරන්න.
  29 மற்றும் 30 ஆம் வினாக்களுக்குப் பொருத்தமான விடையைத் தெரிவு செய்க.
  Select **suitable answer** for questions no. **29** and **30**.

29. පහත සඳහන් පද අතුරෙන් යුගල පදයක් නොවන්නේ කුමක් ද?
(1) වතුපිටි (2) නුසුදුසු (3) යානවාහන (4) පොත්පත්

30. අද සිකුරාදා නම් අනිද්දා කවරදා ද?
(1) බදාදා (2) සෙනසුරාදා (3) ඉරිදා (4) බ්‍රහස්පතින්දා

- අංක 31 සහ 32 යන එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක සම්බන්ධ කර එක් වාක්‍යයක් ලෙස නිවැරදිව ලියා ඇති වාක්‍යය තෝරන්න.
  31 மற்றும் 32 ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் இணைத்து ஒரு வாக்கியமாக்கி சரியாக எழுதப்பட்ட வாக்கியத்தைத் தெரிவு செய்க.
  Two Sentences are given in each questions no. **31** and **32**. Select the **correct sentence** that combined both seperate sentences.

31. මම බඩු අරගත්තෙමි. මම ගෙදර ගියෙමි.
(1) මම ගෙදරට බඩු අරගත්තෙමි.
(2) මම බඩු ගෙදර ගෙන ගියෙමි.
(3) මම ගෙදර ගොස් බඩු අරගත්තෙමි.
(4) මම බඩු අරගෙන ගෙදර ගියෙමි.

32. තරගකරුවෝ පැමිණියහ. තරගය ආරම්භ විය.
(1) තරගකරුවන් පැමිණ තරගය ආරම්භ කළහ.
(2) තරගකරුවන් පැමිණ තරගය ආරම්භ කළේ ය.
(3) තරගකරුවන් පැමිණි පසු තරගය ආරම්භ විය.
(4) තරගකරුවන් පැමිණියාම තරගය ආරම්භ වූහ.

- අංක 33 සහ 34 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.
  33 மற்றும் 34 ஆகிய வினாக்களில் கீறிட்ட இடங்களுக்கு மிகவும் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.
  Select the **most suitable word** for filling the blanks in questions no. **33** and **34**.

33. මට ........................................................ දෙන්න.
(1) පොතෙන් (2) පොතක් (3) පොතකින් (4) පොත්වලින්

34. ........................................................ මෙහාට එන්න.
(1) ඉක්මන් (2) ඉක්මන (3) ඉක්මනට (4) ඉක්මනේ

- 35 ප්‍රශ්නයට උත්තර සපයන්න.
  35 ஆவது வினாவிற்கு விடையளிக்குக.
  Answer question no. **35**.

35. "මෙම ප්‍රතිමාව වසර 2312 ක් පැරණි ය." ඉහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත සංඛ්‍යාව අකුරෙන් නිවැරදිව ලියා ඇති උත්තරය තෝරන්න.
(1) දෙසිය තුන්සිය දොළහ
(2) විසිතුන් දහස් දොළහ
(3) දෙදහස් තිස් එක් දෙක
(4) දෙදහස් තුන්සිය දොළහ

www.pastpapers.wiki

www.pastpapers.wiki

අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
36 தொடக்கம் 40 வரையான வினாக்களில் இலக்கண ரீதியாக சரியான வாக்கியத்தைத் தெரிவு செய்க.
Select the **gramatically correct** sentence in question from **36** to **40**.

36. (1) නරඹන්නා ඔල්වරසන් දෙයි.
(2) නරඹන්නෝ ඔල්වරසන් දෙයි.
(3) නරඹන්නන් ඔල්වරසන් දෙති.
(4) නරඹන්නා ඔල්වරසන් දෙති.

37. (1) වෙළෙඳ ව්‍යාපාරිකයෝ උදවු කළේ ය.
(2) වෙළෙඳ ව්‍යාපාරිකයෝ උදවු කළහ.
(3) වෙළෙඳ ව්‍යාපාරිකයන් උදවු කළෝ ය.
(4) වෙළෙඳ ව්‍යාපාරිකයෝ උදවු කළා ය.

38. (1) අපි උපදෙස් පිළිපදිති.
(2) අපි උපදෙස් පිළිපදිමි.
(3) අප උපදෙස් පිළිපදිමු.
(4) අපි උපදෙස් පිළිපදිමු.

39. (1) ජගත් සහ අමීර් රැස්වීමට සහභාගි විය.
(2) ජගත් සහ අමීර් රැස්වීමට සහභාගි වූයේ ය.
(3) ජගත් සහ අමීර් රැස්වීමට සහභාගි විණ.
(4) ජගත් සහ අමීර් රැස්වීමට සහභාගි වූහ.

40. (1) දෙමව්පියන් විසින් ආහාරපාන රැගෙන එන ලදී.
(2) දෙමව්පියෝ විසින් ආහාරපාන රැගෙන එන ලදී.
(3) දෙමව්පියන් විසින් ආහාරපාන රැගෙන එනු ලැබූහ.
(4) දෙමපියෝ විසින් ආහාරපාන රැගෙන ආහ.

www.pastpapers.wiki

www.pastpapers.wiki

දෙවන බස - සිංහල II
இரண்டாம் மொழி - சிங்களம் II
**Second Language - Sinhala II**

- **I** කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළු ව **II** කොටසින් **එක්** ප්‍රශ්නයක් ද **III** කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් උත්තර ලියන්න.
பகுதி **I** இல் 1 ஆம் 2 ஆம் வினாக்கள் உட்பட பகுதி II இல் ஒரு வினாவையும் பகுதி III இல் இரு வினாக்களையும் தெரிவுசெய்து எல்லாமாக ஐந்து வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.
Answer only **five** questions including questions no. **1** and **2** in Part **I** and selecting **one** question from the Part **II two** questions Part **III**.

## I කොටස/ பகுதி I /Part I

1. දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන වචන 100ක පමණ රචනයක් ලියන්න.
பின்வரும் தலைப்புகளுள் ஒன்றைத் தெரிவு செய்து கீழே தரப்பட்ட விடயங்களை உள்ளடக்கி ஏறத்தாழ 100 சொற்களில் அமையுமாறு கட்டுரை எழுதுக.
Write an essay of about **100 words** on any **one** of the following topics in accodance with the given guide lines.

(අ) වන සම්පත රැකගනිමු
   (i) වනාන්තර පිළිබඳ හැඳින්වීම
   (ii) වානාන්තරවල ප්‍රයෝජන
   (iii) වනාන්තර විනාශ වෙමින් පැවතීම
   (iv) වනාන්තර රැකගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග
   (v) සමාලෝචනය

(ආ) මටත් පියාපත් ලැබුණොත්
   (i) කල්පිත මාතෘකාවක් සේ සලකා රචනයට අදාළ පසුබිම සැකසීම
   (ii) පියාපත් ලැබුණොත් කරන දේ උපකල්පනය කිරීම
   (iii) හදිසියේ ම පියාපත් ලැබීම
   (iv) පියාපත් ලැබීම නිසා පුදුමයට පත් වීම
   (v) සමාලෝචනය/නිගමනය

(ඉ) අපේ ගෙවත්ත
   (i) ගෙවත්ත පිළිබඳ හැඳින්වීම
   (ii) ගෙවත්තක වගා කළ හැකි දේ
   (iii) ගෙවත්තෙන් ඇති ප්‍රයෝජන
   (iv) ඔබේ ගෙවත්තේ ස්වභාවය
   (v) සමාලෝචනය/නිගමනය


(ඊ) ගංවතුර උවදුර නැති කරමු
   (i) ගංවතුර ඇති වන ආකාරය
   (ii) ගංවතුර උවදුරක් වන ආකාරය
   (iii) ගංවතුරෙන් ඇති වන හානි
   (iv) ගංවතුර උවදුරෙන් මිදීමට කළ හැකි දේ
   (v) සමාලෝචනය/නිගමනය

(උ) ජල සම්පත සුරකිමු
   (i) ජල සම්පත හඳුන්වා දීම
   (ii) ජල සම්පත විනාශ වෙමින් පැවතීම
   (iii) ජල සම්පත රැකගැනීමේ අවශ්‍යතාව
   (iv) ජල සම්පත රැකගැනීමට අපට කළ හැකි දේවල්
   (v) සමාලෝචනය

www.pastpapers.wiki

www.pastpapers.wiki

2. දී ඇති පින්තූරය බලා, ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය පහක් ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන හතරක්වත් තිබිය යුතු ය.)
கீழே தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு ஐந்து கருத்துள்ள வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்பட்சம் நான்கு சொற்களாவது இருத்தல் வேண்டும்.)
Compose **five** meaningfull sentences with reference to the given picture.
(There should be **four** words minimally in a sentence.)



**II කොටස/ பகுதி II /Part II**

- 3 හා 4 යන ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර සපයන්න.
3 ஆம் 4 ஆம் வினாக்களுள் ஒரு வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
Answer **one** question from questions **3** and **4**.

3. පහත සඳහන් ගීතය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் பாடலை வாசித்து அதன் கீழ் வினவப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Answer the given questions with reference to the following song.

අම්මා අම්මා මා ආදර අම්මා
මගේ ම ආදර අම්මා

දස මස මා කුසේ දරා
ලේ කිරි කරලා මට පොවලා
මා තුරුලේ නිදි කරවා
මා ඇති දුඩි කළ මා ආදර අම්මා

අම්මා අම්මා මා ආදර අම්මා
මගේ ම ආදර අම්මා

කවි ගී ගයලා
සුරතල් කරලා
තුරුලට අරගෙන
සෙනෙහස පාලා
මට බත් කැවුවා

අම්මා අම්මා මා ආදර අම්මා
මගේ ම ආදර අම්මා



www.pastpapers.wiki

www.pastpapers.wiki

කරුණා දයා ගුණෙන්

ඔවදන් දී

පාසල් යවලා

යහ මග පෙන්වන මා ආදර අම්මා

අම්මා අම්මා මා ආදර අම්මා

මගේ ම ආදර අම්මා

(i) ගීතයේ සඳහන් දරුවා නිදි කරවන්නේ කොහේ ද?
(ii) දරුවා සුරතල් කිරීම සඳහා කියන්නේ මොනවා ද?
(iii) දරුවා බත් කන්නේ කොහේ සිට ද?
(iv) 'අවවාද' යන වචනය සඳහා ගීතයේ යෙදී ඇති වචනය ලියන්න.
(v) ගීතයෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද?

4. පහත දැක්වෙන පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப் பகுதியை வாசித்து அதன் கீழ் வினவப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Answer the given questions with reference to the following prose text.

එක්තරා වනාන්තරයක හිවලෙක් වාසය කළේ ය. එක් දවසක් ඌ කෑම සොයා ඇවිද්දේ ය. ටික දුරක් යන විට ඌට ශබ්දයක් ඇසුණේ ය. හිවලා එම ශබ්දයෙන් මහත් සේ බියට පත් වූයේ ය. භීතියට පත් වූ හිවලා පඳුරු අස්සේ සැඟවී ශබ්දය ඇසෙන දෙස සෝදිසි කර බැලුවේ ය. මෙසේ සෝදිසි කරමින් ඉදිරියට ගිය හිවලා පිට්ටනියක් වැනි මුඩු බිම් ප්‍රදේශයකට පැමිණියේ ය. ශබ්දය ළං ළං වී ඇසෙන්නට විය. එහෙත් අවට කිසිවකුත් පෙනෙන්නට නොවී ය. තව තවත් හොඳින් බැලුවේ ය. ටික වේලාවක් හිවලා ඒ දෙස බලා සිටියේ ය. එය බෙරයක් බව හිවලාට වැටහුණේ ය.

(i) හිවලා වාසය කළේ කොහේ ද?
(ii) හිවලා ඇවිද්දේ කුමක් සඳහා ද?
(iii) හිවලා බියට පත් වූයේ ඇයි?
(iv) බියට පත් වූ හිවලා කළේ කුමක් ද?
(v) අවසානයේ හිවලාට දක්නට ලැබුණේ කුමක් ද?

## III කොටස/ பகுதி III /Part III

- 5 හා 6 යන ප්‍රශ්න දෙකට ම උත්තර සපයන්න.
5 மற்றும் 6 ஆகிய இரண்டு வினாக்களுக்கும் விடை எழுதுக.
**Answer both questions 5 and 6.**

5. 'සුරුවිරුගම' ජාතික පාසලේ ක්‍රීඩා උත්සවය 2017.01.05 දින සුරුවිරුගම ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාංගනයේ පැවැත්වීමට සැලසුම් කර ඇත. ක්‍රීඩා උත්සවය ප.ව. 2.00 සිට ප.ව. 4.00 තෙක් පැවැත්වේ. පෙ.ව. 8.00 සිට ප.ව. 2.00 තෙක් කාලය උත්සවය සඳහා ක්‍රීඩාංගනය සූදානම් කිරීමට යොදා ගැනේ. පාසලේ ක්‍රීඩා භාර ආචාර්ය සුනිල් කරුණාතිලක ඔබ යැයි සිතන්න.

අදාළ දිනයේ දී ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය වෙන් කර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත යවන ලිපිය ලියන්න.

உரிய நாளிலே பிரதேச சபையினது விளையாட்டு மைதானத்தை ஒதுக்கிக் கொள்வதற்காக பிரதேச சபைத் தலைவருக்கு அனுப்ப வேண்டிய கடிதத்தை எழுதுக.

Write a letter to the chairman of the provincial council to reserve the playground of the provincial council on the relevant day.

නැතහොත්

அல்லது

Or



www.pastpapers.wiki

www.pastpapers.wiki

'සුරුවිරුගම' ජාතික පාසලේ කලා උළෙල 2017.02.10 දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. උත්සවය පෙ.ව 10.00 සිට ප.ව. 3.00 තෙක් පැවැත්වේ. විවිධ ප්‍රසංගයකින් ද සාහිත්‍ය දේශනයකින් ද උළෙල විචිත්‍රවත් වේ. උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහභාගි කර ගැනීමට විද්‍යාලයේ කලා සංගමය තීරණය කර ඇත.

ඉහත තොරතුරු ඇසුරෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යවන ආරාධනා පත්‍රය සකස් කරන්න.

மேலேயுள்ள தகவல்களை அடிப்படையாகக் கொண்டு வலயக் கல்விப் பணிப்பாளருக்கு அனுப்பப்படும் அழைப்பிதழைத் தயாரிக்குக.

Prepare an invitation card to be forwarded to the zonal director of education on the basis of the above information.

6. පහත දක්වෙන දෙමළ/ඉංග්‍රීසි වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் / ஆங்கில வாக்கியங்களை சிங்களத்தில் மொழி பெயர்க்க.
Translate the following Tamil/English sentences into **Sinhala.**

(i) எனது தந்தை ஒரு வங்கி முகாமையாளராவார்.
(ii) நாம் டெனிஸ் விளையாட்டை விளையாடுவோம்.
(iii) உங்களிடம் யாழ்ப்பாணம் போவதற்குப் போதுமானளவு பணம் இருக்கிறதா ?
(iv) எல்லோரும் இன்று சந்தோஷமாக உள்ளனர்.
(v) நீர் எப்போது இந்தியா போவதற்குத் தீர்மானித்துள்ளீர் ?

(i) My father is a bank manager.
(ii) Let us play Tennis.
(iii) Do you have enough money to go to Jaffna?
(iv) Everybody is happy today.
(v) When do you plan to visit India?

නැතහොත්
அல்லது
Or

ඔබ පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කෞතුකාගාරය නැරඹීම සඳහා යාමට තීරණය කර ඇත. ඒ සඳහා කලින් අවසර ලබා ගැනීමට ඔබ කෞතුකාගාර නිලධාරියකු හමු වේ. එහි දී ඔබ සහ කෞතුකාගාර නිලධාරියා අතර ඇති වන කතාබහ පහත දක්වෙන කරුණු උපයෝගි කරගෙන සංවාදයක ස්වරූපයෙන් ලියන්න.

உமக்கும் நூதனசாலை அலுவலருக்கும் இடையே நடையே நடைபெறும் கலந்துரையாடலை கீழே காட்டப்பட்டுள்ள விடயங்களைப் பயன்படுத்தி உரையாடல் வடிவில் எழுதுக.

Write a dialogue on the basic of a discussion between you and the museum officer according to the given facts.

**(i) ආමන්ත්‍රණය සහ සුබපැතීම**
**(ii) පැමිණි කාරණය දැනුම දීම**
**(iii) නැරඹිය හැකි දේ පිළිබඳ තොරතුරු විමසීම**
**(iv) දිනයක් වෙන් කර ගැනීම**
**(v) ස්තුති කිරීම**

www.pastpapers.wiki

www.pastpapers.wiki

I කොටස

| | | |
|---|---|---|
| 1 - 2 | 16 - 3 | 31 - 4 |
| 2 - 4 | 17 - 1 | 32 - 3 |
| 3 - 1 | 18 - 4 | 33 - 2 |
| 4 - 2 | 19 - 3 | 34 - 3 |
| 5 - 1 | 20 - 2 | 35 - 4 |
| 6 - 4 | 21 - 2 | 36 - 1 |
| 7 - 1 | 22 - 1 | 37 - 2 |
| 8 - 3 | 23 - 2 | 38 - 4 |
| 9 - 3 | 24 - 4 | 39 - 4 |
| 10 - 1 | 25 - 2 | 40 - 1 |
| 11 - 2 | 26 - 1 | |
| 12 - 1 | 27 - 3 | |
| 13 - 3 | 28 - 1 | |
| 14 - 4 | 29 - 2 | |
| 15 - 4 | 30 - 3 | |

www.pastpapers.wiki

www.pastpapers.wiki

# අ.පො.ස. (සිංහල) දෙවන බස සිංහල - 2016

## II කොටස

## 1 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

### (අ) වන සම්පත රැකගනිමු

වනාන්තර වනාහි අප සතු මා හැඟි සම්පතකි. ස්වභාව ධර්මයාගේ අපූරු දායාදයක් වන වනාන්තර ගස් කොළං සතා සිව්පාවාගෙන් සමන්විත ය. රටක පැවැත්ම මෙන්ම මිනිස් ජීවිතවලද පැවැත්ම වනාන්තර මනා රඳා පවතී.

මිනිසාට ජීවය ලබාදීමේ සිට මිනිස් ජීවිතයේ අවසන් තත්පරය දක්වාම වනාන්තරය තුළින් ඉටු වෙන සේවය අතිමහත් ය. පිරිසිදු වාතාශ්‍රය ලබාදීම, ඖෂධ වර්ග, ආහාර ලබාදීම, ජල උල්පත් ආරක්ෂා කිරීම, දව ලබාගැනීම පාංශු ඛාදනය වැළැක්වීම ආදි ප්‍රයෝජන රැසකි. වනාන්තරය නිසා පාරිසරික සුන්දරත්වය ආරක්ෂා වන අතර සත්ව හා මිනිස් සංහතියේ පැවැත්ම තහවුරු කරන්නේ වනාන්තර ය.

එහෙත් වර්තමානය වන විට මිනිසාගේ අයුතු ක්‍රියාකාරකම් නිසාවෙන් වනාන්තර විනාශ වෙමින් පවතියි. මිනිසා පටු ලාභ අපේක්ෂාවෙන් ගස් වැල් කපා දමා සතුන් විනාශකර දමයි. මෙම හේතුව නිසාවෙන් ස්වභාවික සමතුලිතතාවය බිඳී යයි. රටම කාන්තාරයක් බවට පත්වේ. ජල උල්පත් විනාශ වී යයි. එවිට නියං තත්ත්වයන්ට පව මුහුණදීමට සිදුවේ.

වනාන්තර විනාශ නොකර ආරක්ෂා කරගැනීම අප කාගේත් යුතුකමකි. එහෙයින් වනාන්තරවල අගය ගැන ඒවායේ ප්‍රයෝජන ගැන සමාජය දැනුවත් කළ යුතු ය. ගස් කැපීම වෙනුවට ගසක් සිටුවීමට පාසල් මට්ටමේ සිට ම ළමුන් හුරු කරවිය යුතු ය. තවද වනාන්තර තව තවත් ඇති කරගෙන රටේ දේශගුණ තත්ත්වය යහපත් කිරීමට කටයුතු කළ යුතු ය. එවිට ස්වභාව සෞන්දර්යයෙන් අනූන රටක් අපට නිර්මාණය කර ගත හැක.

### (ආ) මටත් පියාපත් ලැබුණොත්

මට පියාපත් ලැබුණොත් මා ඉමහත් සතුටට පත්වෙමි. මම මගේ පියාපත් විහිදා අහසේ ඉහළටම පියඹා යමි. මම කුරුල්ලෙක් සේ අවට සිරි නරඹමින් ගස් මුදුන්වල සැරි සරමි. මා පුළුන් රොදක් සේ හරිම සැහැල්ලුවෙන් පියඹා යමි.

මා ඉතාමත්ම සතුටින් හැකිතාක් දුර පියඹා යමි. වනාන්තර, මල් ගොමු අතර සැරිසරමින් පරිසරයේ සුවය අත්විඳින්නෙමි. යහළුවන් සමඟ ගස් මුදුන්වල සෙල්ලම් කරන්නෙමු. පලතුරු ගස්වල වසා ඉදුණු නැවුම් පලතුරු ආහාරයට ගන්නෙමි.

මා හට පියාපත් හිමිවීම මාගේ වාසනා මහිමයකි. පියාපත් දෙක මා ඉතාමත්ම ඕනෑකමින් ආරක්ෂා කරන්නෙමි. මේ තරම් සුන්දර පියාපත් දෙකක් මා හට ලැබීම තරම් සතුටක් මට නැති තරම් ය.

ලෝකය වටා පියාඹා ලස්සන නරඹන්නෙමු ගංගා සයුරු තරණය කරමින් මා පියඹා යමි. පියාපත් ලැබීම තරම් සතුටක් මට තවත් නැත. මම එය සතුටින් භුක්ති විඳින්නෙමි. එසේනම් මට පියාපත් ලැබේවායි මම එකසිතින් ප්‍රාර්ථනා කරමි.

### (ඇ) ගංවතුර උවදුර නැති කරමු

ගංවතුර තත්ත්වයක් ඇතිවන්නේ අධික වර්ෂාපතනය නිසා ය. වර්ෂාව වැඩිවීමත් සමඟ පහත් බිම් ජලයෙන් යට වී ගංවතුර තත්ත්වයකට මුහුණ පෑමට සිදු වේ. එසේ ගංගා, ඇළ දොළ පිටාර ගැලීම නිසාද ගංවතුර තත්ත්වයන් ඇති වේ.

ගංවතුර මිනිස් ජනාවාස කරා පැමිණීමත් සමඟ එහි බලපෑම මිනිසාට ඇති වේ. එම බලපෑම නිසා මිනිස් ජීවිතවලට දැඩි අවදානමක ඇති වේ. ඒ නිසා ගංවතුර තත්ත්වය උවදුරක් බවට පත් වේ. මිනිස් ජීවිතවලට දේපළවලට බලපෑම් කරන ගැටලුවක් බවට එවිට ගංවතුර උවදුර පත් වේ.

www.pastpapers.wiki

www.pastpapers.wiki

# අ.පො.ස. (සිංහල) දෙවන බස සිංහල - 2016

## II කොටස

## 1 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

### (අ) වන සම්පත රැකගනිමු

වනාන්තර වනාහි අප සතු මා හැඟි සම්පතකි. ස්වභාව ධර්මයාගේ අපූරු දායාදයක් වන වනාන්තර ගස් කොළං සතා සිව්පාවාගෙන් සමන්විත ය. රටක පැවැත්ම මෙන්ම මිනිස් ජීවිතවලද පැවැත්ම වනාන්තර මනා රඳා පවතී.

මිනිසාට ජීවය ලබාදීමේ සිට මිනිස් ජීවිතයේ අවසන් තත්පරය දක්වාම වනාන්තරය තුළින් ඉටු වෙන සේවය අතිමහත් ය. පිරිසිදු වාතාශ්‍රය ලබාදීම, ඖෂධ වර්ග, ආහාර ලබාදීම, ජල උල්පත් ආරක්ෂා කිරීම, දව ලබාගැනීම, පාංශු ඛාදනය වැළැක්වීම ආදි ප්‍රයෝජන රැසකි. වනාන්තරය නිසා පාරිසරික සුන්දරත්වය ආරක්ෂා වන අතර සත්ව හා මිනිස් සංහතියේ පැවැත්ම තහවුරු කරන්නේ වනාන්තර ය.

එහෙත් වර්තමානය වන විට මිනිසාගේ අයුතු ක්‍රියාකාරකම් නිසාවෙන් වනාන්තර විනාශ වෙමින් පවතියි. මිනිසා පටු ලාභ අපේක්ෂාවෙන් ගස් වැල් කපා දමා සතුන් විනාශකර දමයි. මෙම හේතුව නිසාවෙන් ස්වභාවික සමතුලිතතාවය බිඳී යයි. රටම කාන්තාරයක් බවට පත්වේ. ජල උල්පත් විනාශ වී යයි. එවිට නියං තත්ත්වයන්ට පව මුහුණදීමට සිදුවේ.

වනාන්තර විනාශ නොකර ආරක්ෂා කරගැනීම අප කාගේත් යුතුකමකි. එහෙයින් වනාන්තරවල අගය ගැන ජීවයේ ප්‍රයෝජන ගැන සමාජය දැනුවත් කළ යුතු ය. ගස් කැපීම වෙනුවට ගසක් සිටුවීමට පාසල් මට්ටමේ සිට ම ළමුන් හුරු කරවිය යුතු ය. තවද වනාන්තර තව තවත් ඇති කරගෙන රටේ දේශගුණ තත්ත්වය යහපත් කිරීමට කටයුතු කළ යුතු ය. එවිට ස්වභාව සෞන්දරයෙන් අනූන රටක් අපට නිර්මාණය කර ගත හැක.

### (ආ) මටත් පියාපත් ලැබුණොත්

මට පියාපත් ලැබුණොත් මා ඉමහත් සතුටට පත්වෙමි. මම මගේ පියාපත් විහිදා අහසේ ඉහළටම පියඹා යමි. මම කුරුල්ලෙක් සේ අවට සිරි නරඹමින් ගස් මුදුන්වල සැරි සරමි. මා පුළුන් රොදක් සේ හරිම සැහැල්ලුවෙන් පියඹා යමි.

මා ඉතාමත්ම සතුටින් හැකිතාක් දුර පියඹා යමි. වනාන්තර, මල් ගොමු අතර සැරිසරමින් පරිසරයේ සුවය අත්විඳින්නෙමි. යහළුවන් සමඟ ගස් මුදුන්වල සෙල්ලම් කරන්නෙමු. පලතුරු ගස්වල වසා ඉදුණු නැවුම් පලතුරු ආහාරයට ගන්නෙමි.

මා හට පියාපත් හිමිවීම මාගේ වාසනා මහිමයකි. පියාපත් දෙක මා ඉතාමත්ම ඕනෑකමින් ආරක්ෂා කරන්නෙමි. මේ තරම් සුන්දර පියාපත් දෙකක් මා හට ලැබීම තරම් සතුටක් මට නැති තරම් ය.

ලෝකය වටා පියාඹා ලස්සන නරඹන්නෙමු ගංගා සයුරු තරණය කරමින් මා පියඹා යමි. පියාපත් ලැබීම තරම් සතුටක් මට තවත් නැත. මම එය සතුටින් භුක්ති විඳින්නෙමි. එසේනම් මට පියාපත් ලැබේවායි මම එකසිතින් ප්‍රාර්ථනා කරමි.

### (ඊ) ගංවතුර උවදුර නැති කරමු

ගංවතුර තත්ත්වයක් ඇතිවන්නේ අධික වර්ෂාපතනය නිසා ය. වර්ෂාව වැඩිවීමත් සමඟ පහත් බිම් ජලයෙන් යට වී ගංවතුර තත්ත්වයකට මුහුණ පෑමට සිදු වේ. එසේ ගංගා, ඇළ දොළ පිටාර ගැලීම නිසාද ගංවතුර තත්ත්වයන් ඇති වේ.

ගංවතුර මිනිස් ජනාවාස කරා පැමිණීමත් සමග එහි බලපෑම මිනිසාට ඇති වේ. එම බලපෑම නිසා මිනිස් ජීවිතවලට දැඩි අවදානමක ඇති වේ. ඒ නිසා ගංවතුර තත්ත්වය උවදුරක් බවට පත් වේ. මිනිස් ජීවිතවලට දේපළවලට බලපෑම් කරන ගැටලුවක් බවට එවිට ගංවතුර උවදුර පත් වේ.

www.pastpapers.wiki

www.pastpapers.wiki

ගංවතුර උවදුර නිසා සිදුවන හානි රැසකි. මිනිස් ජීවිත පවා විනාශ වේ. මිනිස් ජීවිත, දේපළ, වගාවන්, සත්ව ජීවිත ආදි හානිදායක තත්ත්වයක් ඇති වේ. ගංවතුර සිය දහස් ගණන් ජීවිත බිලි ගනී. එසේම මිනිස්සු තම ජීවිත කාලය පුරාම ඉපයූ දේවල් එක මොහොතකින් විනාශ වී යයි. එසේම අක්කර දස දහස් ගණනක් වගාකරන වගාවන් විනාශ වේ. මෙවැනි අහිතකර හානි රැසක් ගංවතුර නිසා ඇති වේ.

ගංවතුර උවදුරෙන් මිදීමට රජය විසින් ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. ඒ අතර ක්‍රමවත්ව ජලය බැහැර කිරීමට වැඩපිළිවෙලක් සැකසීම ප්‍රධාන වේ. මිනිසා විසින් පහත් බිම් ගොඩ කිරීම නිසාවෙන් ගංවතුර තත්ත්වයකට මුහුණ පෑමට සිදුවේ. එහෙයින් කළ යුතු වන්නේ ස්වභාවික පරිසරය ආරක්ෂා කරන ගමන් මිනිස් අහිතකර ක්‍රියා නැවතීමට පියවර ගැනීම ය. එවිට අපට ගංවතුර උවදුරෙන් මිදීමට අපහසු නොවේ.

## (ඉ) අපේ ගෙවත්ත

අප නිවස ආශ්‍රිත ප්‍රදේශය ගෙවත්ත ලෙස සරලව ම හඳුන්වාදිය හැක. සෑම පුද්ගලයකුගේ ම ජීවිතයේ මානසික තෘප්තිය ඇති කිරීමට ගෙවත්ත වැදගත් වේ. ගෙවත්ත දෙස බලා සැනසෙන මිනිස්සු බොහෝ වෙති. තම විවේක කාලය ඵලදායි ලෙස ගත කිරීමට ගෙවත්ත ප්‍රයෝජනයට ගත හැක.

ගෙවත්තේ වගා කළ හැකි දේ බොහෝ ය. ඒ අතර එළවළු, පලතුරු, පලාවර්ග, සෙවණ සහිත ගස්, මල් පැළ ආදිය සුවිශේෂී වේ. තම තමන්ගේ කැමැත්තට අනුව ඕනෑම දෙයක් ගෙවත්තේ වගා කළ හැක. එය කායික මෙන්ම මානසික සැනසීමට හේතු වේ.

වර්තමාන කාර්යබහුල සමාජ තත්වයත් සමඟ ගෙවත්තෙන් අපට ගත හැකි ප්‍රයෝජන රැසකි. කාබනික ද්‍රව්‍යවලින් තොර තම අභිමතයට සරිලන එළවළු පලතුරු නිවසේ සිටම අපට වගා කර ගත හැක. මින් මුදල් ඉතුරුවනවා මෙන්ම කිසිදු බියකින් සැකයකින් තොරව පිරිසිදු එළවළු පලතුරු ආහාරයට ගත හැක. එසේම ගෙවත්ත පිරිසිදුව තබා ගැනීමට මේ තුළින් අවස්ථාව සැලසේ.

මගේ ගෙවත්ත ඉතා සුන්දර ස්ථානයකි. ගෙවත්ත වටේම අඹ, කජු, ජම්බු වැනි පලතුරු ගස්වලින් වට වී ඇත. බණ්ඩක්කා, වට්ටක්කා, වැටකොළු පතෝල, මෑ කරල්, මිරිස් වැනි බෝග එහි වගා කර ඇත. වගාවට එන කෘමීන්ගෙන් ගෙවත්ත රැක ගැනීමට තැනින් තැන පාට පාට මල් වර්ග වවා ඇත. සමනලුන්, කුරුල්ලන් ඉගිලී යන විවිධ එළවළු පලතුරුවලින් පිරි ගෙවත්ත මට සැනසුම ලබා දෙයි. අපි සියලු දෙනාම අපට හිමි ඉඩෙන් උපරිම ඵල ලබාගැනීමට සුන්දර ගෙවත්තක් නිර්මාණය කර ගනිමු.

## (උ) ජල සම්පත සුරකිමු

අප රටේ භූමි ප්‍රමාණයෙන් වැඩි කොටසක් ආවරණය වී ඇත්තේ ජලයෙනි. එහෙත් භාවිතයට ගත හැක්කේ ඉතා සුළු ජල ප්‍රමාණයකි. එහෙයින් ජලය අපට සම්පතකි. එය ආරක්ෂා කරගැනීම අප කාගේත් යුතුකමකි.

වර්තමානයේ මිනිස් ක්‍රියාකාරකම් නිසා ජල සම්පත විනාශ වෙමින් පවතියි. මිනිසාගේ අහිතකර කටයුතු නිසා ජලය දූෂණය වේ. ඒ අතර කර්මාන්ත ශාලාවලින් පිට කරන අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීම, කෘමි නාශක සේදීම, සතුන් නැවීම, වාහනවල විෂ වායු ජලයට බැහැර කිරීම වැනි හේතු නිසා ජලය අපවිත්‍ර වේ.

මෙම හේතු නිසා ප්‍රයෝජනයට ගත හැක්කේ සුළු ජල ප්‍රමාණයකි. එහෙයින් ජල සම්පත රැකගැනීමේ අවශ්‍යතාවය දැඩි වී ඇත. මේ වන විටත් මිනිසා ජලයට මිලක් නියම කර ඇත. අනාගතයේදී ජලය විකුණුම් ද්‍රව්‍යයක් බවට පත් වී ඇත. එහෙයින් අප සතු ජල සම්පතේ අගය වටහා ගත යුතු ය.

ජල සම්පත රැකගැනීමට අපට සෘජුවම දායක විය හැක. ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම ඒ අතර ප්‍රධාන වේ. එසේම අප සතු ජලය පිරිසිදු කර පානයට යොමු විය යුතු ය. එපමණක් නොව ජලය ලැබෙන මූලියන් ආරක්ෂා කිරීමට පියවර ගත හැක. තවද වැසි ලබාගන්නා මූලයන් ඇති කළ යුතු ය. එවිට අපට ජල සම්පත ලබාගත හැකි අතරම ජලය අරපිරිමැස්මෙන් භාවිතයෙන් ජල හිඟයෙන් ආරක්ෂා වීමට පුළුවන.

www.pastpapers.wiki

www.pastpapers.wiki

## 2 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

(i) අවුරුදු උත්සවය සිරියක් අවටින් දිස් වේ

(ii) පිටියේ අවුරුදු තරග රැසක් ම පැවැත් වේ.

(iii) එක් තරගකරුවෙක් කණා මුට්ටිය බිඳීමට ආසන්න ය.

(iv) තවත් තැනක තරගකරුවෝ පිරිසක් ග්‍රිස් ගහේ නගති.

(v) තවත් පිරිසක් මෙම තරග දෙස උනන්දුවෙන් බලා සිටිති.

(ලකුණු 2 × 5 = 10 යි)

## 3 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

(i) මවගේ තුරුලේ

(ii) කවි, ගී

(iii) මවගේ තුරුලේ සිට

(iv) ඔවදන්

(v) අම්මා ගැන

(ලකුණු 2 × 5 = 10 යි)

## 4 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

(i) වනාන්තරයක

(ii) කෑම සෙවීම සඳහා

(iii) ශබ්දයක් ඇසීම නිසා

(iv) පඳුරක් අසල සැඟවී ශබ්දය ඇසෙන දෙස සෝදිසි කිරීම.

(v) බෙරයක්

(ලකුණු 2 × 5 = 10 යි)

www.pastpapers.wiki

www.pastpapers.wiki

## 5 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

සුනිල් කරුණාතිලක,
ක්‍රීඩා භාර ආචාර්ය,
සුරුවිරුගම ජාතික පාසල,
සුරුවිරුගම.
2017.12.24

සභාපතිතුමා,
ප්‍රාදේශීය සභාව,
සුරුවිරුගම

සභාපතිතුමනි,

<u>ක්‍රීඩා පිටිය වෙන්කර ගැනීම</u>

අප පාසලේ ක්‍රීඩා උත්සවය 2017.01.05 වන දින සුරුවිරුගම ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේ පැවැත්වීමට සැලසුම් කර ඇත. ක්‍රීඩා උත්සවය එදින ප.ව 2 සිට 4.00 දක්වා පැවැත් වේ පෙ.ව 8 සිට ප.ව 2 තෙක් කාලය ක්‍රීඩා පිටිය සුදානම් කිරීමට නියමිත ය. එහෙයින් මේ සඳහා ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය වෙන්කර දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි,
මෙයට,

..................................
ක්‍රීඩා භාර ආචාර්ය

**(මුළු ලකුණු 10 යි)**

# සුභද ආරාධනයයි!

සුරුවිරුගම ජාතික පාසලේ කලා
උලෙළ 2017.02.10 දින
පෙ.ව 10.00 සිට ප.ව 03.00 දක්වා
විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදී
පැවැත් වේ.
කලා උලෙළ විවිධ ප්‍රසංගයකින්
සහ සාහිත්‍යය දේශනයකින් විචිත්‍රවත් වේ.
මෙම අවස්ථාවට පැමිණ ලෙස ඔබතුමාට
ගෞරවයෙන් ආරාධනා........!

විද්‍යාලීය කලා සංගමය

**(මුළු ලකුණු 10 යි)**

www.pastpapers.wiki

www.pastpapers.wiki

## 6 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

i. මගේ තාත්තා බැංකුවක කළමණාකාරවරයෙක්

ii. අපි ටෙනිස් සෙල්ලම් කරමු.

iii. ඔබට යාපනේ යන්න ප්‍රමාණවත් මුදල් තිබේ ද?

iv. හැමෝම අද සතුටින් සිටිති.

v. ඔබ ඉන්දියාවට යාමට සැලසුම් කර ඇත්තේ කවදා ද?

**(ලකුණු 2 × 5 = 10 යි)**

| | | |
|---|---|---|
| සමන් | :- | සුබ උදෑසනක් වේවා සර්! |
| නිලධාරියා | :- | ඔබටත් එසේම වේවා! |
| සමන් | :- | සර් අපේ පාසලේ ළමයින්ට කෞතුකාගාරය නැරඹීමට අවශ්‍ය වෙලා තියනවා මේ සඳහා ඔබතුමාගේ උපදෙස් අවශ්‍යයයි. |
| නිලධාරියා | :- | බොහොම සතුටුයි. මොනවාද? ඔබට දැනගැනීමට ඕන. |
| සමන් | :- | සර් අපට බලන්න තියන කෞතුක වස්තු මොනව ද? |
| නිලධාරියා | :- | පැරණි කෞතුක වස්තුන් රැසක්ම මෙහි තැම්පත් කරලා තියනවා. ඒ අතර පැරණි බුදු පිළිම, ගෘහ භාණ්ඩ, කාසි, ආයුධ, ආම්පන්න වැනි දේවල් විශේෂයි. |
| සමන් | :- | අපි බොහොම කැමතියි ඒවා දැක බලා ගන්න ලබන 16 වන අගහරුවාදා අපට කෞතුකාගාරය නැරඹීමේ හැකියාව තියනව ද? සර් |
| නිලධාරියා | :- | ඔව්. එදාට තවත් පාසලක් පැමිණීමට නියමිතව තියනව. |
| සමන් | :- | බොහොම ස්තුතියි සර්. |
| නිලධාරියා | :- | බොහොම ස්තුතියි. |

**(මුළු ලකුණු 10 යි)**

www.pastpapers.wiki